**බළන්ගොඩ නගරයේ නගර සභා තානායම සඳහා වූ ටෙන්ඩර් කැඳවීම් පිළිබඳව ටෙන්ඩර් විස්තරය හා ටෙන්ඩර් කොන්දේසි**

1. අසම්පූර්ණ ටෙන්ඩර් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
2. ටෙන්ඩර් අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණ විය යුතුය.
3. මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන් වශයෙන් ලියුම් කවර දෙකක දමා මුද්‍රා තබා එක් එක් ලියුම් කවරයේ දකුණු පස ඉහළ කෙළවරේ අදාල පරිදි මුල් පිටපත , අනු පිටපත යනුවෙන් සඳහන් කර නැවත එම ලියුම් කවර දෙක ලොකු ලියුම් කවරයක බහා එම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ " බළන්ගොඩ නගර සභා තානායම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කර මුද්‍රා තබා ලේඛනගත තැපෑලෙන් යොමු කිරීමෙන් හෝ අතින් ගෙනැවිත් බළන්ගොඩ නගර සභාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් ඉදිරිපත් කළ යුතුය.
4. ටෙන්ඩර් අයදුම්පත්‍රයේ වෙනස් කර හෝ මකා තිබෙන සියළුම තැන්වල අයදුම්කරු අත්සන් කර තිබිය යුතුය.
5. බදු ගැනුම්කරු විසින් තානායමේ තොග ලේඛනයෙහි ඇතුළත්ව ඇති දේපළ, ගෘහ භාණ්ඩ, විදුලි උපකරණ ආදිය (සභාව විසින් භාරදෙනු ලබන උපකරණ හා භාණ්ඩ ලැයිස්තුව) වෙනුවෙන් ආරක්ෂිත ඇප තැන්පතුවක් වශයෙන් තම ලංසු මුදලමෙන් මාස දොලහකට සමාන ඇප මුදලක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් බදු කාලය අවසන් වන තුරු සභාවේ තැන්පත් කළ යුතුය. එය බැංකු බැඳුම්කරයක් (On Demand Bond) වශයෙන් ද ඉදිරිපත් කළ හැක.
6. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුගේ ටෙන්ඩරය පිළිගත හොත් මාස 06ක (හයක) කුලී මුදලට සමාන මුදලක් කාර්යාලයේ තැන්පත් කළ යුතුය. එම තැන්පත් මුදලින් හයෙන් එකක මුදල (මසක බදු කුලිය) ටෙන්ඩර් විවෘත කර පැයක් ඇතුලත තැන්පත් කළ යුතුය. ඉහත කී අන්දමට මුදල් තැන්පත් කිරීමට අපොහොසත් ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් අවලංගු කරන අතර එතෙක් තැන්පත් කරනු ලැබ ඇති ඇප මුදල් සභාව සතු කරනු ලැබේ.
7. තම ටෙන්ඩරය පිළිගතහොත් අදාල ඇප මුදල් තැන්පත් කිරීමට සූදානම්ව ටෙන්ඩර්කරු හෝ ටෙන්ඩර්කරුගේ නියෝජිතයෙකු හෝ පමණක් අනිවාර්යයෙන්ම පැමිණ සිටිය යුතු ය.
8. අදාළ ඇප තැන්පත් කිරීම අවසන් වූ වහාම බළන්ගොඩ නගර සභාව මඟින් ලබා දෙන කාල සීමාව ඇතුලත බළන්ගොඩ නගර සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතු අතර එසේ කිරීමට අපොහොසත් වන ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩරය අවලංගු වනු ඇත.
9. පිළිගත් ටෙන්ඩර්කරුවෙකු විසින් තමන් ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයේ සඳහන් බදු මුදල මාස්පතා ගෙවිය යුතුය. එම මුදල එක් එක් මාසයේ දහය (10) වන දිනට හෝ ඊට පෙර බළන්ගොඩ නගර සභා කර්යාලයට ගෙවිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වන සෑම වාරිකයක් සඳහාම සියයට දහයක් (10%) බැගින් දඩ මුදලක් මාසික කුලී මුදලට අමතරව අය කරනු ලැබේ.
10. තම බදු කාලය තුල දී බදුගැනුම්කරු විසින් තමන් බද්දට ගත් තානායම හෝ ඉන් කොටසක් හෝ අතුරු බදු දීම හෝ උකස් කිරීම හෝ එකී භුක්තිය අන් අයෙකුට කිසිම අයුරකින් පැවරීම හෝ බෙදීමක් හෝ හවුල් ව්‍යාපාරයක් බවට පත්කිරීම හෝ කිසිසේත්ම නොකළ යුතුය. එසේ කළහොත් සතියක කල්දීමෙන් පසු බදු ගිවිසුම අවලංගු කිරීමටත් තානායම ආපසු ලබා ගැනීමටත් බළන්ගොඩ නගර සභාවේ සභාපති / ලේකම් වෙත බලය රඳවාගනු ලැබේ. ඒ සඳහා වන්දියක් හෝ මාස 06ක ඇප තැන්පතුව ඉල්ලීමට බදුගැනුම්කරුට අයිතියක් නොමැත.
11. පිළිගත් ටෙන්ඩර්කරු විසින් බදු කාලය අවසන් වන වර්ෂ.......................... ක් වූ .................. මස ............. වන දින තානායමෙන් ඉවත් වී බළන්ගොඩ නගර සභාවේ සභාපති / ලේකම් හෝ ඔහුගේ

අනුප්‍රාප්තිකයෙකුට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන නිලධාරියෙකුට බළන්ගොඩ තානායමේ නිරවුල් සන්තකය ආපසු භාරදිය යුතුය.

12. පිළිගත් ටෙන්ඩර්කරු විසින් බදුගෙන ඇති තානායම බදු ලබා ගත් කාර්යය සඳහා හැර වෙනත් කිසිම කාර්යයක් සඳහා හෝ නීති විරෝධී වන කාර්යයක් සඳහා හෝ භාවිතා නොකළ යුතුය.

13. මධ්‍යම රජයේ හෝ සබරගමුව පළාත් සභාවේ ප්‍රතිපත්තිමය තීරණයක් මත හෝ බළන්ගොඩ නගර සභාවේ සභාපති / ලේකම් හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයෙකුට හෝ බදුගැනුම්කරුගේ එකගතාවය මත බදුගැනුම්කරු වෙත ලිත් මසකට නොඅඩු කාලයකට කල් දීමෙන් බදු ගිවිසුම අවලංගු කිරීමට පළමු පාර්ශවයට බලය තිබේ. එවැනි අවස්ථා වලදී පිළිගත් ටෙන්ඩර්කරු විසින් තමා විසින් වර්ෂයේ ඉදිරි කාලයට සරිලන මුදල ඔහු වෙත ආපසු ගෙවනු ඇත.

14. රජය විසින් නියම කරනු ලබන ජාතික වශයෙන් හෝ ආගමික වශයෙන් වැදගත්කමක් ඇත්තාවූ දින වල දී හෝ නගර සභා තීරණයක් පරිදි හෝ සුරාබදු දෙපාර්තමේන්තුව නියමකරන ලද දිනවලදී තානායමේ රට බීමහල වසා තබන ලෙස තානායම බදු ගැනුම්කරුට නියම කිරීමට මෙම සභාවේ සභාපති / ලේකම් හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයෙකුට බලය තිබේ. එවැනි අවස්ථාකදී බදු කුලිය අඩු කරන ලෙස ඉල්ලා සිටීමට හෝ වන්දියක් ඉල්ලා සිටීමට හෝ වෙනත් ආකාරයේ හිමිකමක් ඉල්ලා සිටීමට බදු ගැනුම්කරුට අයිතිවාසිකමක් නොමැත.

15. තානායම් පනතට යටත්ව මෙම තානායම පවත්වාගෙන යා යුතු අතර රටබීමහල සඳහා ලබාගෙන ඇති ර.බී. 12 බලපත්‍රය ටෙන්ඩර්කරු විසින් වාර්ෂිකව බදු මුදල් ,මුද්දර ගාස්තු සහ අලුත් කිරීමේ ගාස්තු ගෙවා ලබාගත යුතු අතර එහි සඳහන් කොන්දේසි වලට ද යටත්ව කටයුතු කළ යුතු ය.

16. තානායමට අනුබද්ධ රටබීම හල පවත්වා ගැනීමට අදාළ රෙගුලාසි සම්බන්ධයෙන් පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශවය විසින් බැඳුම්කරයකට අත්සන් කරනු ලබන අතර එකී බැඳුම්කරය මෙම තානායම පවත්වාගෙන යාමේ කාර්යය සම්බන්ධයෙන් එකඟ වන ගිවිසුමේ කොටසක් වශයෙන් සලකා කටයුතු කරන බවට එකඟවිය යුතුය.

17. බළන්ගොඩ නගර සභාවේ සභාපති / ලේකම්ගේ හෝ අනුප්‍රාප්තිකයාගේ ලිඛිත අවසරයක් නොමැතිව තානායම වසා නොතැබිය යුතුය.

18. තානායමෙන් ඉවත්වන යම් දිනෙක තානායමේ සවිකර ඇති උපකරණ යථාතත්වයෙන් ආපසු භාරදිය යුතු අතර යම් අලාභහානියක් සිදු වී ඇත්නම් සභාපති / ලේකම් හෝ ඔහුගේ බලයලත් නිළධාරියෙකු විසින් ඉදිරිපත් කරනු ලබන තක්සේරුවකට අනුව සිදුව ඇති අලාභය ආරක්ෂිත ඇප තැන්පත් මුදලින් අයකරගෙන ඉතිරියක් වේ නම් එය ආපසු ගෙවීමට කටයුතු කරනු ඇත. කිසියම් හේතුවකින් සිදුව ඇති අලාභය පියවීමට ආරක්ෂිත ඇප බැඳුම්කරය ප්‍රමාණවත් නොවන්නේ නම් එකී හිඟ මුදල බදුගැනුම්කරු විසින් සභාවට ගෙවිය යුතුය.

19. බළන්ගොඩ තානායමේ හෝ තානායම් පරිශ්‍රයේ ඇති භාණ්ඩවලට සිදුවන කිසිදු අලාභහානියක් සම්බන්ධව බළන්ගොඩ නගර සභාවේ සභාපති / ලේකම් වගකියනු නොලැබේ. අවශ්‍යයැයි හැඟෙන්නේ නම් ඒ සඳහා රක්ෂණාවරණයක් ලබාගැනීම සඳහා නගර සභාවේ විරුද්ධත්වයක් නොමැත. එහෙත් එසේ කිරීමට පෙර සභාවේ ලිඛිත අවසරය ලබාගත යුතුය.

20. බදුගැනුම්කරු විසින් තමන් බදුගෙන ඇති තානායම බදු කාලය අවසන් වීමට පෙර පළමු පාර්ශවය වෙත ආපසු භාර දෙන්නේ නම් ලිත් මාසයක කල්දීමෙන් පසුව එසේ කළ හැකි ය. එසේ බදු කාලය අවසන් වීමට පෙර තානායම ආපසු භාර දීමේ දී මාසයක බදුකුලිය සභාවට ගෙවිය යුතු ය. එවැනි අවස්ථාවක සභාවේ තැන්පත්කර ඇති ගිවිසුම් ඇප තැන්පත් මුදල ආපසු ඉල්ලා සිටීමට බදුගැනුම්කරුට කිසිදු හිමිකමක් නොමැත.

21. නොකඩවා මාස දෙකක් බදු කුලී නොගෙවූවහොත් තෙවන මාසය ඉක්ම යාමට ප්‍රථම සිදු කරන දැනුම් දීමකින් තොරව තානායම බළන්ගොඩ නගර සභාවට පවරා ගනු ලබන අතර ඒ සම්බන්ධයෙන් වන අලාභ හානි බදු ගැනුම්කරු විසින් දැරිය යුතු වන්නේය.
22. ගිවිසුම්ගත මාසික කුලී මුදල, අවම වශයෙන් වසර 03කට වරක් රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත සංශෝධනය කිරීමට  නගර සභාවට හැකියාව ඇති අතර  මාසික කුලී මුදල සංශෝධනය වන සෑම අවස්ථාවකම එම සංශෝධිත කුලී මුදල ගෙවීමට බදු  ගැනුම්කරු කටයුතු කළ යුතුය.
23. ඔබ විසින්  පවත්වාගෙන යනු ලබන තානායමේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් වාර්ෂිකව වෙළඳ බලපත්‍රයක් ඒ ඒ වර්ෂයේ පළමු කාර්තුව ඇතුළත පළාත් පාලන ආයතනයෙන් ලබාගත යුතු අතර ව්‍යාපාරික බද්ද ගෙවිය යුතු කාරණාවන්ට අදාළව එම ව්‍යාපාර බද්ද වාර්ෂිකව ගෙවීමට ද යටත් වන්නේ ය.
24. බළන්ගොඩ තානායමේ විදුලි බිල්පත, දුරකථන බිල්පත, රූපවාහිනී සබඳතා ලබාගෙන ඇත්නම් ඊට අදාළ බිල්පත් සහ තානායමට සේවාවන් සපයා ගැනීමේදී ඉදිරිපත් වන අනෙකුත් සියලූ බිල්පත් බදුගැනුම්කරු විසින් අඛණ්ඩව මාසිකව අදාළ ආයතන වෙත හිඟයක් නොතබා ගෙවිය යුතු අතර  ගෙවා අවසන් වූ බිල්පත් මාසික කුලිය ගෙවන අවස්ථාවේදී  බළන්ගොඩ නගර සභාව වෙත භාරදීමට කටයුතු කළ යුතු ය.
25. තානායම් පරිශ්‍රය තුළ කිසිදු ඉදිකිරීමක් හෝ භෞතික වෙනස් කිරීමක් හෝ නඩත්තු කටයුත්තක් සිදුකළ නොහැකි අතර එවැනි වෙනස් කිරීමක් හෝ ඉදිකිරීමක් හෝ නඩත්තුවක් අවශ්‍ය විටෙක දෙවන පාර්ශවය විසින් ඒ පිළිබඳව බළන්ගොඩ නගර සභාව ලිඛිතව දැනුවත්කර ලිඛිත අවසරයක් ලබාගැනීමට කටයුතු කළ යුතුය.
26. බදු ගැනුම්කරු විසින් සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියාවක් හෝ නඩු නිමිත්තකට විෂය වන සිද්ධියක් සම්බන්ධයෙන් බළන්ගොඩ නගර සභාව හෝ එහි අනුප්‍රාප්තිකයෙකු හෝ වග  නොකියන අතර එ කී ක්‍රියාවන් සම්බන්ධයෙන් බදුගැනුම්කරු පෞද්ගලිකව වගකිව යුතුය.
27. තානායම හා අවට පරිශ්‍රය පිරිසිදුවත් සනීපාරක්ෂාවට හිතකර අන්දමටත් පරිහරණය කිරීම සඳහා අවශ්‍යයයි නගර සභාවේ නිලධාරීන් විසින් නියම කරනු ලබන සියළුම ආකාරයේ උපකරණ හා බඳුන්ද බදුගැනුම්කරු විසින් එම පරිශ්‍රය තුළ තම වියදමින් සපයා තිබිය යුතුය.
28. ගලි සේවාව සපයා ගැනීම හෝ පළාත් පාලන ආයතනයක් මගින් හෝ වෙනත් පාර්ශවයක් මගින් සේවාවන් සපයා ගැනීමේදී එම ආයතනයන්ගේ නීති රීතීන්ට අනුගතව නියමිත ගාස්තු ගෙවා එකී සේවාවන් සපයාගත යුතුය.
29. තානායම පවත්වාගෙන යාම සඳහා ගිවිසුම්ගත වූ පසු බදුගැනුම්කරු ඔහුගේ නියෝජිතයන් හා සේවකයන් විසින් එම පොරොන්දු පත්‍රයේ අන්තර්ගත ප්‍රතිඥා හා කොන්දේසි නගර සභාව විසින් පනවා ඇති පොදු වෙළඳපල පිළිබඳ අතුරු ව්‍යවස්ථා හා ඉදිරියේදී පන්වනු ලබන අතුරු ව්‍යවස්ථා වෙතොත් ඒවාද වෙනත් අණ පනත් වලින් නියම කෙරෙන විධිවිධාන  ද කඩ නොකළ යුතු අතර එකී කවර හෝ එකක් හෝ කිහිපයක් කඩ කරනු ලැබුවහොත් එය වරදක්වන අතර එකී වරද හේතුකොට එම ගිවිසුම අවලංගුකර බදුගැනුම්කරුගේ වෙළඳ අයිතිය අහෝසිකර මෙම බළන්ගොඩ තානායම බළන්ගොඩ නගර සභාවට පවරාගැනීමට කටයුතු කරනු ලැබේ.
30. ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවසාන තීරණය බළන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුය .
31. මෙහි සඳහන් නොවූ කිසියම් කොන්දේසියක් මීට අදාල ටෙන්ඩර් දැන්වීමේ සඳහන් වන්නේ නම් එකී කොන්දේසි ද බදුගැනුම්කරු විසින් පිළිගත යුතුය.
32. එක් පුද්ගලයෙකුට අදාළ කොන්දේසි වලට යටත්ව අයදුම්පත්‍ර කිහිපයක් වුව ද ලබාගෙන ඉදිරිපත් කල හැකිය.

33. එවැනි අවස්ථාවකදී එකී පුද්ගලයා විසින් ඉදිරිපත් කරනු ලබන වැඩිම ලංසුව පමණක් ලංසු ඇගයීමට යොදා ගනු ලබන අතර එම නමින් ඉදිරිපත් කර ඇති අනෙකුත් ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

34. ඉහත 33 වන වගන්තියේ දක්වා ඇති අවස්ථාවක් මත ලංසු ප්‍රතික්ෂේප වුවහොත් ටෙන්ඩර් ඇප තැන්පත් මුදල් ආදිය සභාව සතු වන්නේ ය.

35. මෙහි සඳහන් කොන්දේසියක් කුමන ආකාරයකින් හෝ කඩකිරීමක් සිදුකර ඇති බව සනාථ වන්නේ නම් එම ටෙන්ඩර් අයදුම්පතට අදාළ ටෙන්ඩර් ඇප නිදහස් කිරීමක් සිදු නොවන අතර අදාල ටෙන්ඩර් ඇප මුදල ද සභාව සතු වන්නේය.